# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරු සිසු අත්වැල

**(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)**

## Business Studies

නිපුණතාව 2.0

ව්‍යාපාර පරිසරයට අනුගත වීම සඳහා ව්‍යාපාර, සමාජයයී වගකීම් හා ආචාරධර්ම කෙරෙහි සැලකිලිමත් වන ආකාරය විමසයි.

---

**ව්‍යාපාරයන්හි සමාජ වගකීම සහ ව්‍යාපාර ආචාර ධර්ම**


**අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා**

**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ**

**සම්පත් දායකත්වය : H.P.K.D. සඳමාලි**

**ර/ මැදබැද්ද මහා විද්‍යාලය**


**වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය**

**නිපුණතා මට්ටම 2.1 :** ව්‍යාපාර විසින් සමාජයයී වගකීම ඉටු කිරීමේ  වැදගතක් ම අගයයි

**කාලච්ඡේද සංඛ්‍යාව :** 08

**ඉගෙනුම් ඵල :**

- පිළිගත් නිර්වචන ඇසුරෙන් ව්‍යාපාර සමාජයීය වගකීම හඳුන්වයි.
- ව්‍යාපාර විසින් සමාජයීය වගකීම් ඉටු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි
- ව්‍යාපාරවලින් සමාජයීය වගකීම ඉටු විය යුතු පාර්ශ්ව ලැයිස්තුගත කරයි.
- ව්‍යාපාරයක් විසින් එක් එක් පාර්ශ්වය වෙත ඉටු කළ යුතු සමාජයීය වගකීම් වෙන වෙන ම නිදසුන් සහිත ව ඉදිරිපත් කරයි.
- ව්‍යාපාර ආයතනයක් නිදසුනක් ලෙස ගෙන එය එක් එක් පාර්ශ්වය වෙත සමාජයීය වගකීම් ඉටු කරන ආකාරය පෙන්වා දෙයි.
- සමාජයයී වගකමී ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට හිමි වන ප්‍රතිඵලාභ ලැයිස්තු ගත කරයි.
- සියලු ම පාර්ශ්වයන්ගේ අපේක්ෂා ඉටු වන ආකාරයට සමාජයීය වගකීම් ඉටු කළ හැකි ආකාරය පැහැදිලි කරයි.



# ව්‍යාපාරයන්හි සමාජ වගකීම සහ සමාජ ආචාර ධර්ම

# Social Responsibility of Business Ethics

ව්‍යාපාරය හා සම්බන්ධ සියලුම උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට උපරිම අයුරින් සාධාරණයක් ඉටු වන ආකාරයට කටයුතු කිරීම සමාජීය වගකීම වේ.

උදා:-

"සමස්ත සමාජයේ සහ ප්‍රදේශයේ ජනතාවගේත් සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල් වලත් ජීවන තත්වය නංවාලීමට සහ රටේ ආර්ථික සංවර්ධනයට දායක වන බවට හා සදාචාර්ත්මකව හැසිරෙන බවට ව්‍යාපාර වල අඛණ්ඩ කැපවීම ව්‍යාපාරයන්හි සමාජීය වගකීමයි."

World business council for sustainable development

ව්‍යාපාර සමාජීයීය වගකීම පිළිබඳව විවිධ රටවල් විසින් ද නිර්වචන ඉදිරිපත් කර ඇත.

## ඇමරිකා එක්සත් ජනපදය (USA)

"සිය ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳවත්, එමගින් සමාජයට ඇති වන බලපෑම් පිළිබඳවත් පෞද්ගලිකව ම ව්‍යාපාර වගකීම සමාජීයීය වගකීමයි."

## පිලිපීනය

"ව්‍යාපාර, සමාජයට ආපසු දෙන දෑ සමාජීයීය වගකීමයි.

ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට හා පොදුවේ සමාජයට බලපෑම් ඇති කරන බලවේග කිහිපයක් වර්ධනය වෙමින් පවතී.

උදා:-

- ව්‍යාපාර තරඟය
- ගෝලීයකරණය
- විද්‍යුත් ව්‍යාපාර
- පරිසර දූෂණය

එසේම ව්‍යාපාර වලින් සමාජීයය වගකීම් ඉටු විය යුතු ප්‍රධාන පාර්ශව කිහිපයකි.

උදා:-

- ගනුදෙනුකරුවන්
- සේවකයින්
- අයිතිකරුවන්
- සමාජය

එක් එක් පාර්ශවය වෙත ව්‍යාපාර සමාජයීය වගකීම් ඉටු විය යුතු ආකාරය පහත රූප සටහනින් ද දැක්විය හැකිය.

- සාධාරණ වීම.
- හානි අවම වීම.
- අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම.

ගනුදෙනුකරුවන්

- සමානාත්මතාව
- මනා සේවක සම්බන්ධතා
- වෘත්තීමය ආරක්ෂාව
- සෞඛ්‍ය පහසුකම්

සේවකයින්

**ව්‍යාපාරය**

අයිතිකරුවන්

- සාධාරණ ඉපයීමක් ලබා දීම.
- ආර්ථික ප්‍රතිලාභ අත්කර දීම.
- කාර්යක්ෂමව හා අවංක ලෙස කළමණාකරණය කටයුත

සමාජය

- රැකියා නියුක්තියට දායක වීම.
- බදු ගෙවීම නොපිරිහෙලා ඉටු කිරීම.
- අපද්‍රව්‍ය කළමණාකරණය
- ප්‍රජා සත්කාර සේවා
- හරිත නිෂ්පාදිත

## සමාජීයීය වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට අත්වන ප්‍රතිලාභ

- ❖ ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කිරීම.
- ❖ ව්‍යාපාරයේ ප්‍රතිරූපය / කීර්ති නාමය වර්ධනය වීම.
- ❖ ව්‍යාපාරය පිළිබඳ විශ්වාසනීයත්වය තහවුරු කිරීම.
- ❖ ගනුදෙනුකරුවන් තෘප්තිමත් කළ හැකි වීම.
- ❖ ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ කරා ලගා වීමට පහසු වීම.

## මිහිකත සමුලුව - Earth Summit

පරිසර හා සංවර්ධනය පිළිබඳ වූ එක්සත් ජාතීන්ගේ සම්මේලනය ( The United Nations on Environment Development) මිහිකත සමුළුව ලෙස කෙටියෙන් හඳුන්වනු ලබයි. ප්‍රථම මිහිකත සමුලුව 1992 ජූනි 3 - 14 දක්වා බ්‍රසීල RIO de Janeiro නගරයේ පවත්වන ලදී. ඊට රටවල් 178 ක රාජ්‍ය නියෝජිතයෝ සහභාගී වූහ.

ජෛව විවිධත්වය පිළිබඳ ප්‍රඥප්තියකට ද සාමාජික රටවල් අත්සන් තබන ලදී. තවද ස්වාභාවික පරිසර කලාප විනාශ වීමට හේතු වන මුදල් ඉපැයීමේ අරමුනින් කරන ක්‍රියාකාරකම් අවම කරලීමට විධිවිධාන සැලසීමට එකඟතාව පළ කෙරිනි.

## කියෝටෝ සම්මුතිය - Kyoto Protocol

පුද්ගලයන්ට අයත් ස්වාභාවික දේශයක (භූමියක) පරිසරය කෙලසන හෝ සංස්කෘතික වශයෙන් නුසුදුසු කිසිදු කටයුත්තක් පවත්වා ගෙන නොයන බවට මිහිකත සමුලුවට ඇතුලත් සාමාජික රටවල් විසින් ඇති කර ගන්නා ලද ගිවිසුම කියෝටෝ සම්මුතිය ලෙස හඳුන්වයි.

ව්‍යාපාර දායක වන ආකාරය අගයයි.

**කාලච්ඡේද සංඛ්‍යාව : 06**

**අපේක්ෂිත ඉගෙනුම් ඵල :**

- තිරසර සංවර්ධනය යන්න පැහැදිලි කරයි.
- ව්‍යාපාරයකට තිරසර සංවර්ධනය සඳහා දායක විය හැකි ආකාරය පැහැදිලි කරයි.
- පවතින ව්‍යාපාරයක් නිදසුනක් ලෙස ගෙන එය තිරසර සංවර්ධනයට දායක වන ආකාරය පෙන්වා දෙයි.
- පාරිභෝගිකයාට තිරසර සංවර්ධනයට දායක විය හැකි ආකාරය පැහැදිලි කරයි.

# තිරසර සංවර්ධනය - Sustainable development

තිරසර සංවර්ධනය යනු,

අනාගත පරම්පරාවේ අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය උල්ලංඝනය නොකරමින් වර්තමාන අවශ්‍යතා ලගා කර ගන්නා වූ සංවර්ධනයයි. එය ගොඩනැගී ඇත්තේ සමාන වැදගත්කමක් ඇති කුළුනු 3ක් මතය.

1. ආර්ථික තිරසර සංවර්ධනය - Economic Sustainable Development
2. පරිසර තිරසර ආරක්ෂණය - Environment Sustainable Development
3. සමාජ තිරසර සංවර්ධනය - Environment Sustainable Development

## ආර්ථික තිරසර සංවර්ධනය

සම්ප්‍රදායිකව ආර්ථික වර්ධනය යනු දළ දේශිය නිෂ්පාදිතයේ වර්ධනයයි.තිරසර ආර්ථික සංවර්ධනයේදී සම්පත් පරිභෝජනය අඩු කර, ජීවන තත්වය උසස් කිරීම මගින් මානව සුභ සාධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. තවද,

- ❖ ජනතාවගේ දුප්පත් කම නැති කිරීම.
- ❖ ජීවන තත්වය උසස් කිරීම.
- ❖ සෑම දෙනාටම දැරිය හැකි මිලකට පරිසර හිතකාමී නිෂ්පාදන බිහි කිරීම ද,

  මේ තුලින් අපේක්ෂා කෙරේ.

## පරිසර තිරසර ආරක්ෂණය


මූලික මිනිස් අවශ්‍යතා වන වාතය, ජලය, ආහාර හා නිවාස යනාදිය ගුණාත්මකභාවයෙන් පැවතීම හා ඒවා ආරක්ෂා කර ගනිමින් පවත්වා ගෙන යාම මගින් මූලික මිනිස් අවශ්‍යතා සපුරාලීම පරිසර තිරසර ආරක්ෂණයෙන් අපේක්ෂා කෙරේ.

## සමාජ තිරසර ආරක්ෂණය

අනාගත පරම්පරාවේ අවශ්‍යතා උල්ලංඝනය නොවන පරිදි වර්තමාන ජනතාවගේ අවශ්‍යතා සපුරාලීම මගින් මානව සංවර්ධනය ඇති කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ. මෙයට අමතරව පහත කරුණු කෙරෙහි සැලකිලිමත් වීම අවධාරණය කෙරේ.

- ❖ සමානාත්මතාව
- ❖ සමාජ ප්‍රාග්ධනය
- ❖ සමාජ ඒකාබද්ධතා ප්‍රජා සහභාගිත්වය හා සංවර්ධනය
- ❖ මානව හිමිකම්
- ❖ සමාජ වගකීම්
- ❖ සමාජ සාධාරණත්වය සෑම පුද්ගලයෙකුටම ලබා දීම.

## තිරසර සංවර්ධන සංකල්පය




ආර්ථික තිරසර බව සඳහා ව්‍යාපාර වල දායකත්වය

ව්‍යාපාරයක් ආර්ථික තිරසර බව වෙනුවෙන් කටයුතු කරන විට අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයකි.

- ❖ ආර්ථික වර්ධනය හා ස්ථායිතාව
- ❖ කාර්යක්ෂමතාව (සම්පත් භාවිතය)
- ❖ තරඟකාරිත්වය (සාධාරණව)
- ❖ නිෂ්පාදන හා පරිභෝජනය
- ❖ සේවා නියුක්තිය
- ❖ අන්තර්ජාතික වෙළඳාම

## ව්‍යාපාරයකට ආර්ථික තිරසර බව තහවුරු කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග

- රැකියා නිර්මාණය
- කුසලතා බලගැන්වීම
- සම්පත් කාර්යක්ෂම ව භාවිතය
- අවදානම් කළමණාකරණය
- ආර්ථික වර්ධනය බලගැන්වීම.
- පාර්ශවකරුවන්ගේ ප්‍රතිලාභ වර්ධනය
- දේශීය ආර්ථිකය වර්ධනය සඳහා ආයෝජනය
- නවෝත්පාදන හඳුන්වා දීම.
- තාක්ෂණය දියුණු කිරීම.
- ආර්ථිකයේ යටිතල පහසුකම් සංවර්ධනයට දායක වීම.
- සේවක සුභසාධනය
- හුවමාරුව හා ගනුදෙනු ක්‍රියාවලිය දියුණු කිරීම.
- නිෂ්පාදන ක්‍රියාවලිය දිරිගැන්වීම.

## පාරිසරික තිරසර බව සඳහා ව්‍යාපාර වල දායකත්වය

පාරිසරික තිරසර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපාර කටයුතු කරන විට විශේෂ අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයකි.

- සම්පත් පරිභෝජනය
- අමුද්‍රව්‍ය හා අපද්‍රව්‍ය කළමණාකරනය
- අවදානම් කළමණාකරනය
- ස්වාභාවික හා සංස්කෘතික උරුමයන් සුරැකීම.

## පාරිසරික තිරසර බව තහවුරු කිරීමට ව්‍යාපාරයකට කළ හැකි ක්‍රියාකාරකම්

- පරිසර හිතකාමී දෑ මිලට ගැනීම.
- නිෂ්පාදන ක්‍රියාවලියේදී අමුද්‍රව්‍ය, බල ශක්තිය, ජලය වැනි සම්පත් සුරකිමින් කටයුතු කිරීම.
- අපද්‍රව්‍ය කළමණාකරණයේදී 3R,4R,5R, සංකල්ප භාවිතය
- පරිසර හිතකාමී ප්‍රවාහන ක්‍රම භාවිතය
- අන්තරාකාරී ද්‍රව්‍ය සුරක්ෂිතව භාවිත කිරීම.
- ජලය,වාතය, හා පස දූෂණය අඩු කිරීම.
- ජෛව විවිධත්වය රැකීමට කටයුතු කිරීම.
- පරිසරය සංරක්ෂණය / පරිසර හිතකාමී කටයුතු වලදී රජය හා රාජ්‍ය නොවන ආයතනය සමඟ එක්ව කටයුතු කිරීම.
- සූර්ය ශක්තිය වැනි පරිසර හිතකාමී බලශක්ති භාවිතය

## සමාජ හා සංස්කෘතික තිරසර බව සඳහා ව්‍යාපාර වල දායකත්වය

ව්‍යාපාර ආයතන සමාජ හා සංස්කෘතික තිරසර බව තහවුරු කිරීම සඳහා කටයුතු කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයකි.

- ❖ ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම.
- ❖ ජනතාවට සමාන අවස්ථා සැපයීම.
- ❖ සමාජ ඒකාග්‍රතාවය ඇති කිරීම.
- ❖ ජාත්‍යන්තර සහභාගීත්වය ලබා ගැනීම.
- ❖ මානව ප්‍රාග්ධනය නඩත්තු කිරීම.
- ❖ දේශිය සංස්කෘතිය, සම්ප්‍රදායන් හා සිරිත් විරිත් ආරක්ෂා කිරීම.
- ❖ සංස්කෘතික පරිසරය සුරැකීම.
- ❖ දුගී බව අවම කිරීමට කටයුතු කිරීම. (දිළිඳු ප්‍රජාව)
- ❖ සේවක සම්බන්ධතා

## ව්‍යාපාරයකට සමාජ හා සංස්කෘතික තිරසර බව තහවුරු කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග

- මානව විවිධත්වයට ගරු කරමින් කටයුතු කිරීම.
- මානව අයිතිවාසිකම් සුරැකීමට දායක වීම.
- සමානාත්මතාවෙන් යුතුව කටයුතු කිරීම, හා සම අවස්ථා සැපයීම.
- අධ්‍යාපන,සෞඛ්‍ය, ප්‍රවාහනය, ආදී අත්‍යවශ්‍ය පහසුකම් සඳහා දායක වීම.
- සමාජ රක්ෂණ කටයුතු වලට දායක වීම.
- සංස්කෘතික විවිධත්වය ගරු කිරීම හා සුරැකීමට දායක වීම.
- නීතිය හා සාමය සුගකීමට දායක වීම.

## තිරසර සංවර්ධනය සඳහා ව්‍යාපාර වල නූතන භාවිත

නූතන සමාජයේ නිෂ්පාදන හා පරිභෝජන ක්‍රියාකාරකම් නිසා දිනකට දැරිය නොහැකි ප්‍රමාණයකින් අපද්‍රව්‍ය එකතු වීම ගෝලීය ප්‍රශ්ණයක් බවට පත් ඇත. එබැවින් නිෂ්පාදනයේදී පරිභෝජනයේදී හා අපද්‍රව්‍ය කළමණාකරනයේදී 4R සංකල්පය භාවිතය තුලින් තිරසර සංවර්ධනයක් ලගා කර ගැනීමට අවධානය යොමුව ඇත.

4R - Recycle - (ප්‍රතිචක්‍රීකරණය කිරීම)
Reuse - (නැවත නැවත භාවිත කිරීම)
Reduce - (භාවිතය අඩු කර ගැනීම)
Replace - (නැවත ස්ථාපිත කිරීම)

## **ප්‍රතිචක්‍රීකරණය කිරීම (**Recycle)

මෙහිදී අපද්‍රව්‍ය වෙන් කොට වෙනත් භාණ්ඩයක් නිෂ්පාදනය කළ හැකි ද්‍රව්‍යක් බවට පත් කිරීම සිදු වේ. ද්‍රව්‍ය වල පවතින භෞතික තත්වය වෙනස් කිරීමට ලක් කෙරේ. මෙය දෙආකාරයක නිමැවුම් ලැබෙන සේ සිදු කල හැකිය.

- අඩු වටිනාකමක් ඇති අමුද්‍රව්‍ය ඉහල වටිනාකමක් ඇති නිෂ්පාදිත බවට පත් කිරීම. (Upcycle)

  උදා ඃ- පිදුරු වලින් කඩදාසි නිෂ්පාදනය කිරීම.

- ඉහල වටිනාකමක් ඇති නිෂ්පාදිත අඩු වටිනාකමක් ඇති අමුද්‍රව්‍ය බවට පත් කිරීම. (Low cycle)

  උදා ඃ- ජපානය භාවිතයෙන් ඉවත් කරන වාහන තලා යකඩ බවට පත් කිරීම.

## **නැවත නැවත භාවිත කිරීම (**Reuse)

නිෂ්පාදන කාර්යයේදී හෝ පරිභෝජන කාර්යයේදීනැවත නැවත භාවිත කළ හැකිදේ යොදා ගැනීම මින් අදහස් කෙරේ.

උදා ඃ- කෑම ඔතන පොලිතීන් (lunch sheet) වෙනුවට කෑම පෙට්ටි(lunch box) භාවිතය

## **භාවිත අඩු කිරීම (**Reduce)

පරිසරයට මුදා හරින අපද්‍රව්‍ය ප්‍රමාණය අඩු කිරීම මින් අදහස් වේ. නිෂ්පාදනය හෝ පරිභෝජනය සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය වලින් ඉවත ලන ද්‍රව්‍ය ප්‍රමාණය අඩු කිරීමෙන් මෙම කාර්ය පහසු වේ. එසේම පරිසරයට අහිතකර දේ භාවිතයෙන් ඉවත් කිරීම. භාවිතය ප්‍රතික්ෂේප කිරීම. භාවිත නොකර සිටීම මඟින් තිරසර සංවර්ධනයට දායක විය හැකිය.

උදා ඃ- භාණ්ඩයක ඇසුරුම සඳහා දිරාපත් නොවන පොලිතීන් භාවිත නොකර සිටීම.
පානීය ජලය ප්ලාස්ටික් ඇසුරුම් වල නොදැමීම.

## **නැවත ස්ථාපිත කිරීම (**Replace)

නිෂ්පාදන කටයුතු සඳහා භාවිත කරන ස්වාභාවික සම්පත් වලින් නැවත ස්ථාපිත කිරීම මෙයින් අදහස් වේ.

උදා ඃ- වනයේ දැව අමුද්‍රව්‍ය ලෙස භාවිත කරන ආයතනයක් වන වගා ව්‍යාපෘති ආරම්භ කිරීම.

මත්ස්‍ය කර්මාන්තයේ යෙදෙන ව්‍යාපාර මත්ස්‍ය සංවර්ධනය කිරීම.

5R Refuse - (අපද්‍රව්‍ය ප්‍රතික්ෂේප කිරීම)
Reuse - (නැවත පරිහරණයට ගැනීම)
Reduce - (ඉවතලන ද්‍රව්‍ය අඩු කිරීම)
Recycle - (ප්‍රතිචක්‍රීකරණය)
Rot - (දිරා යන ද්‍රව්‍ය භාවිතය)

## ව්‍යාපාර කටයුතුවල අහිතකර බලපෑම්

01. වැඩි ලාභ අපේක්ෂාවෙන් ගුණත්වයෙන් අඩු භාණ්ඩ අපනයනය කිරීම.
02. දැඩි තරඟකාරීත්වය තුල පාරිභෝගිකයින් රැවටීම.
03. සේවක සුභසාධනය පිළිබඳ නැඹුරුව අඩු වීම.
04. ස්වභාවික සම්පත් අපතේ යන පරිදි නිෂ්පාදන කටයුතු කිරීම.
05. පරිසරය දූෂණය වන පරිදි අපද්‍රව්‍ය මුදා හැරීම.
06. අප රටේ සමාජ සංස්කෘතියට නොගැලපෙන වෙළඳ දැන්වීම් නිර්මාණය කිරීම.
07. සමාජ සංස්කෘතියට නොගැලපෙන ඇඳුම් මෝස්තර නිර්මාණය කිරීම.

## පාරිභෝගිකයෙකු වශයෙන් ඔබට හිතකර සංවර්ධනය සඳහා දායක විය හැකි ආකාර

01. අපද්‍රව්‍ය අඩු කිරීම උදා ඃ- කොම්පෝස්ට් සෑදීම, වල දැමීම.
02. නැවත නැවත පාවිච්චි කළ හැකි දේ භාවිත කිරීම.
03. ප්‍රතිචක්‍රීයකරණයට යොමු වීම.
04. දිරාපත් නොවන ද්‍රවය භාවිත නොකිරීම.
05. පරිසර හිතකාමී (හරිත) නිෂ්පාදිත භාවිතයට යොමු වීම.
06. අත්‍යවශ්‍ය පරිභෝජනයෙන් බැහැර වීම.
07. පරිසරය පිරිසිදුව තබා ගැනීම.
08. පරිසරය ගැන දැනුවත් කිරීමේ වැඩදටහන් පැවැත්වීම.
09. විදුලිය, ජලය වැනි දෑ නාස්තිය අවම කිරීම.
10. ඉන්ධන භාවිතය අවම වීම.
11. කෙටි දුර පයින් යාම
12. රුක් රෝපණය
13. අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විවිධ බහලුම් භාවිතා කිරීම.
14. පරිසර හානියට විරෝධතා දැක්වීම.
15. පරිසර නියමු කණ්ඩායම්,පරිසර සංවිධාන පිහිටුවා ගැනීම.
16. සත්ත්ව ප්‍රජාව සුරැකීම.

**නිපුණතා මට්ටම 2.3 :** ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ආචාරධර්ම පද්ධතියක අවශ්‍යතාව තහවුරු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව : 06**

**ඉගෙනුම් ඵල :**

- ව්‍යාපාර ආචාරධර්ම සංකල්පය පැහැදිලි කරයි.
- ව්‍යාපාරවලින් සිදු වන හොඳ හා නරක දෑ සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.
- ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක් ගොඩනැගීමේ දී සැලකිලිමත් විය යුතු සාදක ලැයිස්තුගත කරයි.
- එක් එක් සාධකය සඳහා සුදුසු වන ව්‍යාපාර ආචාරධර්ම තම අත්දැකීම් ඇසුරෙන් යෝජනා කරයි.
- පවත්නා ව්‍යාපාරයක් සැලකිල්ලට ගෙන එම ආයතනය පිළිපදින ආචාරධර්ම සාකච්ඡා කරයි.
- උපකල්පනය කරන ලද ව්‍යාපාරයකට ගැලපෙන ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක් ගොඩනගයි.
- ව්‍යාපාර ආචාරධර්ම හා සමාජයීය වගකීම් අතර වෙනස පැහැදිලි කරයි.

## ව්‍යාපාර ආචාර ධර්ම

ව්‍යාපාර තමන් සමඟ කටයුතු කරන සියලු පාර්ශව වලට යහපතක් සිදුවන ආකාරයට හොඳ නරක පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම, ව්‍යාපාර ආචාර ධර්ම ලෙස හැඳින්වේ. එය පිළිපැදීම ව්‍යාපාර වලට වැදගත් වේ.

උදා ඃ-

- ගුණාත්මක භාණ්ඩ හා සේවා සැපයීම තුළින් ගනුදෙනුකරුවන්ට සාධාරණය ඉටුවන අතර එමඟින් ව්‍යාපාර පිළිබඳ ඔවුන්ගේ විශ්වාසය ඉහල යාම.
- අලෙවිකරණයට අදාල ආචාර ධර්ම පිළිපැදීම තුලින් ව්‍යාපාරයේ පැවත්ම තහවුරු වීම සහ තරඟකාරීත්වයට සාර්ථක ලෙස මුහුණ දිය හැකිවීම.
- ගිණුම්කරණ කටයුතු වලට අදාළ ආචාරධර්ම පිළිපැදීමෙන් ව්‍යාපාරය තුල සිදුවිය හැකි මූල්‍ය අක්‍රමිකතා,විෂමාචාර පිටු දැකීම තුළින් විශ්වාසය තහවුරු වීම.
- සේව්‍ය සේවක අයිතීන් හා යුතුකම් සුරකින ආචාර ධර්ම තුලින් සේවකයින්ට ජාති, කුල, ආගම් හෝ ස්ත්‍රී/පුරුෂ ආදී වශයෙන් සිදුවන අසාධාරණකම් සිදු නොවීමෙන් මනා මානව සම්පත් කළමණාකරණයක් සිදු වීම.

# ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී සැළකිලිමත් විය යුතු කරුණු.

- ව්‍යාපාරය
- ගනුදෙනුකරණ
- සේවකයා
- තරඟකරුවන්
- සමාජ සංස්කෘතික
- සංවිධාන සංස්කෘතිය
- ප්‍රායෝගික බව

උදා ඃ-

**ව්‍යාපාරය** - ව්‍යාපාරයේ ස්වභාවය කුමක්ද? භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක්ද ? සේවා සපයන ව්‍යාපාරයක්ද? කුඩා පරිමාණ ව්‍යාපාරයක්ද? මහා පරිමාණ ව්‍යාපාරයක්ද? ආදිය සැලකිල්ලට ගැනීම.

**ගනුදෙනුකරු** - ගනුදෙනුකරුගේ ඉල්ලීම් රටා, සන්නිවේදනය,ආගමික සමාජ හා සංස්කෘතීන්ට අදාල කරුණු පිළිබඳව සැලකිලිමත් වීම.

**සේවකයා** - කුමන මට්ටමේ සේවකයෙක්ද ඔවුන්ගේ පරිසරය අවශ්‍යතා හා වුවමණා පිළිබඳ සැලකිලිමත් වීම.

**තරඟකරුවන්** - තරඟකරුවන් සිටීද? ඔවුන් අනුගමනය කරන ආචාර ධර්ම මොනවාද? ආදිය පිළිබඳව සැලකිලිමත් වීම.

**සමාජ සංස්කෘතිය** - ජන වර්ගය තුල මුල් බැසගත් සංස්කෘතික සාරධර්ම හා අගනාකම් උප සංස්කෘතීන් ගැන සැලකිලිමත් වී ආචාර ධර්ම පද්ධතිය සැකසීම.

**සංවිධාන සංස්කෘතිය** - ව්‍යාපාරය තුළ පවතින චාරිත්‍ර,වාරිත්‍ර වටිනාකම්, පුරුදු,ආකල්ප යනාදිය පිළිබඳව සැළකිලිමත් වීම.

**ප්‍රායෝගික බව** - ආචාර ධර්ම පද්ධති සකස් කිරීමේ දී එම ආචාර ධර්ම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇත් ද යන්න පිළිබඳව සැලකිලිමත් වීම.

ව්‍යාපාරය සඳහා සකස් කරන ලද ආචාර ධර්ම ලිඛිතව දැක්වූ විට එය ආචාර ධර්ම පද්ධතිය/ආචාර ධර්ම සංග්‍රහය ලෙස හඳුන්වයි.

## පසුගිය විභාග ප්‍රශ්ණ

## 2019 අගෝස්තු I

04. තිරසර සංවර්ධනය හා සම්බන්ධ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දක්වේ.

A - තාක්ෂණික සංවර්ධනය
B - සේවක සුභසාධනය
C - පරිසර හිතකාමී නිෂ්පාදන මිලදී ගැනීම
D - නවෝත්පාදන හඳුන්වා දීම
E - මානව විවිධත්වයට ගරු කිරීම
F - අවධානම් කළමණාකරණය

ඉහත දෑ අතුරින් ව්‍යාපාරවල ආර්ථික තිරසර බව තහවුරු කර ගැනීම සඳහා කල හැකි ක්‍රියාකාරකම් පමණක් ඇතුලත් වරණය කුමක්ද?

(1) A,B,C,E (2) A,B,D,F (3) B,C,D,E (4) B,D,E,F
(5) C,D,E,F

## 2019 අගෝස්තු II

02. (ii) (අ) 'තිරසර සංවර්ධනය'යන්න පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාරික සංවිධානයකට තම පාරිභෝගිකයින් කෙරෙහි ඇති සමාජ වගකීම් 02 ක් සඳහන් කරන්න.

(iii) ව්‍යාපාර ආචාර ධර්ම පැළිපැදීම තුලින් ව්‍යාපාර සංවිධානයකට ලබා ගත හැකි ප්‍රතිලාභ 4 ක් සඳහන් කරන්න.

## 2018 අගෝස්තු II

01. (v) ව්‍යාපාර සමාජ වගකීම යනු කුමක්දැයි පැහැදිලි කර,වර්තමාන සමාජය තුළ එය වැදගත් වීමට හේතු 03 ක් ලියන්න.

02. (i) ආහාර ද්‍රව්‍ය නිෂ්පාදකයෙකු සිය නිෂ්පාදන වල ගුණත්වය තහවුරු කිරීම සඳහා ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී,ඔහු විසින් සැළකිල්ලට ගතයුතු සාධක හතරක් සඳහන් කර,එම සාධක සැලකිල්ලට ගත යුත්තේ ඇයිදැයි පැහැදිලි කරන්න.

## 2016 අගෝස්තු I

07. ව්‍යාපාර ආයතනයක් විසින් එක් එක් පාර්ශව වලට සමාජ වගකීම් ඉටු කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාකාරකම් කිහිපයක් හා ඊට අදාල පාර්ශවවල ලැයිස්තුවක් පහත වගුවේ දැක්වේ.

| ක්‍රියාකාරකම | පාර්ශව |
|---|---|
| A. ආයතනය තුල වෛද්‍ය ඒකකයක් පිහිටුවීම | 1. රජය |
| B. ජාතිය ගොඩනැගීමේ බද්දට දායක වීම | 2. ගනුදෙනුකරුවන් |
| C. ගිණුම් වාර්තා නියමිත ප්‍රමිති වලට අනුකූලව පිලියෙල කිරීම | 3. සේවකයන් |
| D. භාණ්ඩවල අන්තර්ගතය ලේබලයේ සඳහන් කිරීම | 4. අයිතිකරුවන් |

ඉහත ක්‍රියාකාරකම් හා ඊට අදාල පාර්ශව නිවැරදිව ගලපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 1 , B - 3, C - 2, D - 4 (2) A - 1 , B - 3, C - 4, D - 2

(3) A - 2 , B - 4, C - 3, D - 1 (4) A - 3 , B - 1, C - 2, D - 4

(5) A - 3 , B - 1, C - 4, D – 2

08. ව්‍යාපාරයක් විසින් තම තරඟකරුවන් සැලිකිල්ලට ගනිමින් ගොඩනගා ඇති ආචාර ධර්මයක් වන්නේ,
(1) සියළු සේවකයන්ට සමානව සැළකීම.
(2) ප්‍රචාරණයේදී අන් ව්‍යාපාරික ප්‍රතිරූපවලට හානි නොකිරීමයි.
(3) ආගමික සංකේත ව්‍යාපාර කටයුතු වලට යොදා නොගැනීමයි.
(4) අඉහළ ගුණත්වයකින් යුත් භාණ්ඩ සැපයීමයි.
(5) වැඩිහිටියන්ට ආචාරශීලී වීමයි.

## 2016 අගෝස්තු II

01. (iv) (ආ) බස් රථයක ගමන් කරන මගියෙකු හා කොන්දොස්තර මහතෙකු විසින් පිලිපැදිය යුතු යැයි පොදුවේ පිළිගත් ආචාර ධර්ම දෙක බැගින් ලියන්න.

## 2015 අගෝස්තු II

01. (iv) වර්තමානයේ ව්‍යාපාර බොහොමයක් සමාජ වගකීම් ඉටුකිරීම සඳහා විශාල මුදලක් වැය කරනු ලැබේ.

(අ) සමාජ වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට ලබාගත හැකි ප්‍රතිලාභ හතරක් ලියන්න.

(ආ) ව්‍යාපාරික ආචාර ධර්ම පද්ධතියක් සැකසීමේ දී සැලකිලිමත් විය යුතු සාධක දෙකක් උදාහරණ සහිතව විස්තර කරන්න.

## 2014 අගෝස්තු II

01. (v) (අ) ව්‍යාපාර ආචාර ධර්ම පිළිපැදීම ආයතනයකට වැදගත් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

## 2013 අගෝස්තු I

03. ස්වභාවික පරිසරයේ පවත්නා සමහර සම්පත්,සීමිත එහෙත් නැවත අලුත් කළ හැකි (Finite - renewable) ඒවා වන අතර,සමහරක් සීමිත එහෙත් නැවත අලුත් කල නොහැකි (Finite - renite - nonrenewable) ඒවාය.

A - වන (Forest) B - දියමන්ති (Diamond) C - මසුන් (Fish)

D - ගල් අඟුරු (Coal) E - ආහාර (Food) F - ඛණිජ තෙල් (Petroleum)

ඉහත සඳහන් දෑ අතුරින් සීමිත එහෙත් නැවත අලුත් කල නොහැකි සම්පත් වනුයේ,

(1) A,B,C,D, හා E (2) A,B,D, හා E (3) A,C, හා D

(4) B,C, හා F (5) B,D, හා F

04. ''ව්‍යාපාර සමාජ වගකීම්'' සංකල්පය යනු

(1) '' නීතියට අනුව ව්‍යාපාර කටයුතු සිදු කළ යුතුය'' යන අදහසය.

(2) '' කොටස් කරුවන්ගේ අරමුණු ඉටු කළ යුතුය'' යන අදහසය.

(3) '' ව්‍යාපාරික තීරණ ගැනීමේදී කොටස්කරුවන්ගේ අරමුණු නොසලකා හැරිය යුතුය'' යන අදහසය.

(4) '' ව්‍යාපාරික තීරණ ගැනීමේදී ඇල්මැති පාර්ශවයන්ගේ අරමුණු නොසලකා හැරිය යුතුය'' යන අදහසය.

(5) '' ව්‍යාපාරික තීරණ ගැනීමේදී ගණුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හා වුවමණා සැළකිල්ලට ගත යුතුය'' යන අදහසය.

## 2012 අගෝස්තු I

03. පහත දක්වෙන්නේ ව්‍යාපාරයකින් ඉටුවියයුතු සමාජ වගකීම් කීපයකි.

A - කාර්යක්ෂම කළමණාකරණය B - වෘත්තීමය ආරක්ෂාව

C - ප්‍රජා සත්කාරය D - විනිවිදභාවය

F - සෞඛ්‍යය පහසුකම් G - අපද්‍රව්‍ය කළමණාකරණය

H - රැකියා නියුක්තියට දායක වීම I- සමානාත්මතාව

මේවා අතුරින් සේවක පාර්ශවයට පමණක් ඉටුවිය යුතු සමාජ වගකීම් ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) A,D,F (2) B,E,H (3) C,F,G (4) A,D,I,

(5) B,F,I

## 2012 අගෝස්තු II

01. (v) පහත සඳහන් ව්‍යාපාර ආචාරධර්ම සංකල්ප පැහැදිලි කරන්න.

(අ) සත්‍ය දෑ සන්නිවේදනය කිරීම.

(ආ) අන් අයට හානි නොකිරීම.